# අංක තුන පිළිබඳ ජන විඥනය

කහඳගමගේ, සන්ධ්‍යා
සිංහල අධ්‍යයනාංශය, රුහුණ විශ්වවිද්‍යාලය
spkahandagamage@gmail.com

තුන, තුන්, තුනු, තෙ, ති, තෙ, ත්‍රය, තිය ආදී වශයෙන් ශබ්ද වන අංක තුන සියලු මධ්‍ය ඉන්දු භාෂාවන්හි දී ද ඊට සමීප ශබ්ද ස්වරූප ජනනය කරයි. තින්ග් (මරාටි), තින් (ඔරියා), තිනි (අසාමි), තින් (බෙංගාල/නේපාල), තීන් (හින්දි), ත්‍රි (සංස්කෘත), ති (පාලි), ත්‍රෙ (ලන්ඩා) ,ත්‍රින් (ගුජරාටි) ආදී වූ විවිධ ශබ්ද ස්වරූපයන්ගෙන් හැඳින්වෙන අංක තුන පිළිබඳව සමස්ත ජන සමාජය තුළමවිවිධ විශ්වාස ගොඩනැගී ඇත. චින්තන පද්ධතිය විවිධ ස්වරූපයන් සහ විවිධ දිශාවන් පෙන්නුම් කරයි. අංක තුන වශයෙන් යෙදීම වර්ගීකරණයක් දැක්වීමේ පහසු ක්‍රමවේදයකි. එහෙත් සමාජය තුළ අංක තුන ක්‍රියාත්මක වීමේදී එකතු කිරීම්, අඩු කිරීම්, වැඩිකිරීම් හා බෙදීම් යන සතර ක්‍රියාදමයන්හිම එල යොදා ගෙන තිබීමද විශේෂත්වයකි. අංක තුන කේන්ද්‍ර ගතව ආගමික, සාමාජික, දෛනික, පාරිසරික, ආර්ථික, සංස්කෘතික පද්ධතියක් නිර්මිතව පවතියි. පුරුෂ ලිංගික ප්‍රථම, සංඛ්‍යාව වශයෙන් සැලකෙන අංක තුන කෙරෙහි මුල්කාලීනව හා පසුකාලීන ව විවිධ අදහස් මතුව පවතියි. එම සංඛ්‍යාව ලෝකයේ පැවැත්ම කෙරෙහි ප්‍රබල බලපෑමක් ඇති කරවතැයි සැලකෙයි. අංක තුන පුරාණෝක්ති, ආගම, පරිසරය, නිත්‍ය සාධක, සමාජ භාවිත, නක්ෂත්‍රය, අංක විද්‍යාව ආදී විවිධ අංශයන් සමග දෘඪ සම්බන්ධයක් ගොඩනගාගෙන ඇති නමුත් සංඛ්‍යා ශාස්ත්‍ර කෙරෙහි අපගේ අවධානය යොමු නොවේ. සංඛ්‍යාව පිළිබඳ පවතින විශ්වාස එම සන්දර්භය අනුව විවිධත්වයට ලක්ව වෙයි. පුද්ගල තරාතිරම, ආගමික සංකල්ප, සුබ අසුබ සංකල්පය, නිමිති පිළිබඳ විශ්වාස ආදී විවිධ හේතු සාධක ඊට පාදක වෙයි. ජන චින්තනය සකස්වීමෙහිලා අංක තුන ක්‍රියාත්මක වන ආකාරය - මානව චින්තන පද්ධතිය ස්පර්ශ කෙරෙයි.

මෙම පර්යේෂණය ජනශ්‍රැති අධ්‍යයනයක් වන බැවින් සන්දර්භය සමාජය තුළම තබා කෘත්‍යාත්මක ක්‍රමවේදය ඔස්සේ තොරතුරු එක් රැස් කෙරෙයි. දත්ත දයකයන් වෙත ප්‍රශ්නාවලි යොමු කිරීම, ක්ෂේත්‍ර නිරීක්ෂණය මෙන්ම ලිඛිත ද්විතීයික මූලාශ්‍රය ද ක්‍රමවේදයක් ලෙස භාවිත කෙරෙයි. මෙකී මූලාශ්‍රය ඔස්සේ අංක තුන පිළිබඳ ජන විඥනය සහ චින්තනය කෙබඳුද පරික්ෂා කිරීමට අපේක්ෂිතය.

1. සංඛ්‍යා භාවිත කිරීම පිළිබඳ ජන විඥනය පදනම් වන සාධක පැවතීම - මේ යටතේ පාරිසරික, නිශ්චිත සාධක තාර්කිකව ගැලපීම, ශ්‍රැති සූචනය, ආගමික, පුරාණෝක්ති ආදී වූ සාධක පදනම් කරගෙන අංක තුන භාවිතය කෙරෙහි අවධානය යොමු වෙයි.

2. විකල්ප රූප භාවිතය හා විකල්ප අර්ථ විවරණ ගොඩ නැගීම සිදුවන බව - අංක තුන ආශ්‍රයෙන් වන විකල්ප රූපයන් පිළිබඳව ජන චින්තනය විහිදී ඇති ආකාරය පැහැදිලි කර ගැනෙයි.

***ප්‍රමුඛ පද*** - *අංක තුන, චින්තනය, විශ්වාසය, සංඛ්‍යාව*

NCAS Symposium Proceedings 2015